**එච්. එම්. ප්‍රියංගා පෙරේරා**
සමුද්‍ර පරිසර නිලධාරී
සමුද්‍ර පරිසර ආරක්ෂණ අධිකාරිය

# සොබා දහමේ රුවේ බෙලෙන් - නැංවෙයි අපගේ අනාගතේ

## හැදින්වීම

ශ්‍රී ලංකාව නිරවර්තන කළාපයේ පිහිටි දූපත් රාජ්‍යයක් වන බැවින් ජෛව විද්‍යාත්මක වශයෙන් ඉතාම වැදගත් වන්නාවූ පරිසර පද්ධතීන් රැසකින් යුක්ත වේ. සදාහරිත වනාන්තර, ගංගා ඇළදොළ, කලපු, කඩොලාන වනාන්තර විල්ලු පතන ආදිය ද අපා දෙපා සිවුපා ක්ෂිරපායී උභයජීවී උරග සහ පක්ෂී විශේෂ සහිත වූ ජෛව විවිධත්වයක් බහුලව දක්නට ලැබීම සංචාරක කර්මාන්තයේ ව්‍යාප්තිය සහ සංවර්ධනය සඳහා ප්‍රධාන සාධක ලෙස හඳුනාගත හැකිය. මෙවැනි වූ පරිසර පද්ධතීන්ගේ සංරක්ෂණය, සංවර්ධනය හා සාමාජ ආර්ථික සංවර්ධනයද පාදක කොට ගත් සංකල්පයක් මතින් බිහිවූ පාරිසරික සහ ජනහිතකාමී සංචාරක කර්මාන්තය (Ecotourism) සංචාරකයින් වෙත උපරිම ආශ්වාදය ලබාදෙමින් ක්‍රියාත්මක වීම ලොවපුරා නව ප්‍රවණතාවක් ලෙස අත්දකින්නට ලැබේ. ආර්ථික ප්‍රතිලාභය මෙන්ම පාරිසරික සහ සාමාජීය වශයෙන් උත්පාදනය වන ප්‍රතිඵල පිළිබඳව විවේචනාත්මක මානයකින් අධ්‍යයනය කොට අහිතකර ප්‍රතිඵල අවම කොට ගනිමින් කර්මාන්තය පවත්වා ගැනීම කෙරෙහි උනන්දු වීම මගින් තිරසාර සංවර්ධනයක් කරා ගමන් ගන්නා වර්තමාන සමාජය කෙරෙහි යහපත් බලපෑමක් සිදුකිරීමේ හැකියාවක් පාරිසරික සංචාරක කර්මාන්තය පවතින බව ප්‍රායෝගිකව තහවුරු කළ හැකිය.





තිරසාර සංවර්ධනය නැමැති සංකල්පය විසි එක්වන සියවසෙහිදී ලොව පුරා ප්‍රචලිත වුණු ඉතා වැදගත් සංකල්පයක් වූ අතර එය ප්‍රධාන වශයෙන් ආර්ථිකය සමාජය සහ පරිසරය යන මූලික කරුණු ත්‍රිත්වය මත බලපෑම් කරන්නක් විය. එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් වසර 2030 වනවිට අත්පත්කර ගැනීමේ අපේක්ෂාව සහිතව 2015 වසරේදී සංවර්ධන අරමුණු දාහතක් හඳුන්වාදෙනු ලැබීය. එමගින් සමාජයීය ආර්ථික පාරිසරික සංස්කෘතිකමය යන අංශයන් වෙත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ලොව පුරා පැතිර ඇති සියළුම භෞතික සහ මානව සම්පත් කළමණාකරණය, සංවර්ධනය පවත්වා ගැනීම යන ක්‍රියාවලීන් මෙහෙය වීම අරමුණු කොට ඇත.




ශ්‍රී ලංකාව තුළදී සිදු කෙරෙන සංචාරක කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ගෝලීය තිරසර සංචාරක සංවර්ධන ක්‍රමෝපායන් භාවිතා කිරීම හා වගකීම් සහගතව කටයුතු කිරීමෙන් තිරසර බවින් යුත් සංචාරක කර්මාන්තයක් මෙරට බිහිකිරීමට හැකියාව ලැබේ. එසේම තිරසාර සංවර්ධනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමටද අවස්ථාව ද සැලසෙනු ලැබේ. ඒ අනුව,

- එමගින් සංචාරක කර්මාන්තය මගින් සමාජයට පරිසරයට සහ ආර්ථිකයට ඇතිවන අහිතකර බලපෑම අවම වීම.
- ප්‍රාදේශීය වශයෙන් ජීවත් වන ජනතාව වෙත ලැබෙන ආර්ථික ප්‍රතිලාභ උත්පාදනය බහුලව සිදුවීම හා සමාජ සුබසාධනය සහ ආදායම් ඉපැයීමේ ක්‍රමවේදයන්ගේ ස්වාභාවය වැඩි දියුණු වීම.
- කර්මාන්තය තුළ රැකියා සහ ආදායම් ඉපැයීම සඳහා අවස්ථාවන් බහුලව උත්පාදනය වීම.
- වඳවීමේ. තර්ජනයට ලක්වී ඇති ශාක සහ සත්ත්ව විශේෂ සංරක්ෂණය සඳහා අවස්ථාව සැලසීම.
- ප්‍රාදේශයේ සංවර්ධනය සඳහා මුල්‍යමය සහයෝගයන් හිමි වීම.
- දේශීය වශයෙන් අභිමානයක් ප්‍රජාව වෙත වර්ධනය වීම.
- ආශ්වාදජනක සංචාරක මතකයන් සියළුම පාර්ශවකරුන් වෙත හිමි වීම.

## පාරිසරික සහ ජනහිතකාමී සංචාරක කර්මාන්තයෙන් ලැබෙන්නාවූ ප්‍රතිලාභ

- ප්‍රාදේශීය වශයෙන් අදාල කලාපයන්හි වෙසෙන ජනතාවට රැකියා අවස්ථා උදාවීම.
- ප්‍රධාන ආදායම් මාර්ගවලට අමතරව සංචාරක කර්මාන්තය සමග බැඳුණු ආදායම් මාර්ග බිහිවීම
- ප්‍රදේශයේ ප්‍රජාව වෙත සිය දැනුම සහ පළපුරුද්ද භාවිතා කිරීම සඳහා අවස්ථාවන් ලැබීම.
- කාන්තාවන් සහ තරුණ ප්‍රජාව වෙත ව්‍යාපාරික අවස්ථා උදාවීම
- සංචාරක කර්මාන්තය සමග සම්බන්ධ දේශීය සහ විදේශීය මහා පරිමාණ සහ මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන් විසින් පවත්වනු ලබන තාක්ෂණික සහ තාක්ෂණික නොවන පුහුණු සැසි සඳහා සහභාගිවීමේ අවස්ථා හිමි වීම සහ දැනුම සහ පළපුරුද්ද ලබාගත හැකිවීම.
- රට තුළට විදේශ විනිමය ගලා ඒම ඉහළ යාම.

## පාරිසරික සහ ජන හිතකාමී සංචාරක ව්‍යාපාරය සහ පරිසර සංරක්ෂණය

- අදාල පරිසර පද්ධතීන් සහ ස්වාභාවික වාසස්ථාන සංරක්ෂණය සඳහා පෙළඹවීම් ඇති කිරීම.
- කාර්මීකරණය හෝ කෘෂිකර්මාන්තය මගින් වනාන්තර එළිපෙහෙළි වීම වැළැක්වීම සහ එම කර්මාන්තයන්ට විකල්පයක් ලෙස සංචාරක කර්මාන්තය ස්ථාපිත වීම මගින් පරිසරය සංරක්ෂණය වීම.
- පරිසර හානිය අවම කරමින් ආදායම් උත්පාදනය සිදු කිරීම.
- සංචාරකයින්ට නොයිඳුල් සංවේදී පරිසර පද්ධතින්ගේ ආශ්වාදය විඳ ගැනීමේ හැකියාව පවත්වා ගැනීමට ව්‍යාපාරයේ සියළුම පාර්ශවකරුවන් උනන්දුවීම.
- සංචාරකයින්ගේ ආකර්ෂණය සහ උනන්දුව රඳවා තබා ගැනීම සඳහා නිසි ලෙස කසළ කළමණාකරණය සිදු කිරීම, පරිසර හිත්කාමී බලශක්ති ප්‍රභවයන් භාවිතය, කාර්යක්ෂම බලශක්ති භාවිතය ආදි පරිසර හිතකාමී ක්‍රමවේදයන්ට කර්මාන්තකරුවන් යොමු වීම.

## පාරිසරික සහ ජනහිතකාමී සංචාරක ව්‍යාපාරය සහ සංචාරකයින්

- සංචාරකයින් හට පෞද්ගලිකවම අදාල ස්වාභාවික පරිසරයේ පවතින්නා වු ආශ්වාදජනකවුත් විශ්මජනකවූත් අත්දැකීම් විඳගැනීමට හැකියාව ලැබීම.
- එසේම එක් එක් ප්‍රදේශයෙහි පවතින්නා වු අනන්‍ය සංස්කෘතිකමය සහ සාමාජික ලක්ෂණයන්ගෙන් යුත් සම්ප්‍රදායන් අත්විදීමට අවස්ථාව සැලසීම.



- විවිධ පරිසර පද්ධතීන් සම්බන්ධව දැනුම ආකල්ප වර්ධන කර ගැනීම අවස්ථාව සැලසෙන අතර අදාල පරිසර පද්ධතීන් සංරක්ෂණය දූෂක ප්‍රභව අවම කිරීම ආදී ක්‍රමවේද පිළිබඳව දැනුම වර්ධනය කරගැනීමට අවස්ථාව සැලසීම.

- සංචාරකයින් හට තමා අවට පරිසරය තිරසාර ලෙස සංවර්ධනය කිරීම සහ සංරක්ෂණය කිරීම පිළිබදව ධනාත්මක ආකල්ප වර්ධනය වන අතරම පෞද්ගලික වාසස්ථාන අවට පවතින පරිසර පද්ධතීන් වුවද සංරක්ෂණය සදහා වුවද සංවේදී ආකල්ප සංවර්ධනය වීම.

- සංචාරකයින් විසින් දේශිය ජනතාව විසින් නිෂ්පාදන කරනු ලබන භාණ්ඩ හා සේවාවන් මුදල් ගෙවා ලබා ගැනීම මගින් ප්‍රාදේශීය ජනතාවගේ ආර්ථිකය නැංවීම සදහා දායකවීම පිළිබඳ තෘප්තිමත් හැඟීම් ඇතිවීම.

- තමන් විසින් සංචාරය කරනු ලැබූ විවිධත්වයෙන් යුත් සංචාරක කලාප පිළිබද සිය නෑදෑ හිතමිතුරන් දැනුවත් කිරීම මගින් අදාල සංචාරක කලාප දෙස් විදෙස් සංචාරකින් අතර ප්‍රචලිත වීම.

එසේනම් පාරිසරික සංචාරයකදී නිසි සැලසුම්කරණයක් පැවතිම අත්‍යාවශ්‍ය වේ. සංචාරකයින් වෙත තමන් විසින් සංචාරය කරන ප්‍රදේශය සහ අදාල පරිසර පද්ධතීන් පිළිබදව නිසි අවබොධයක් පැවතිය යුතු අතර අදාල ප්‍රාදේශයේ පෞරාණික වටිනාකම් සහ සංස්කෘතිකමය වටිනාකම පිළිබදවද චත් පිළිවෙත් සහ ඇවතුම් පැවතුම් පිළිබදවද ප්‍රමාණාත්මක දැනුමක් ලබා ගත යුතු වේ. තම සංචාරය පුරාවට පෞද්ගලිකවම නිසි කසළ කළමණාකරන ක්‍රමවේද අනුගමනය කළ යුතුය. එසේම පරිසරය පිළිබද දැඩි ඇල්මක් සහ වගකීමක් සහිත සංචාරක මඟ පෙන්වන්නන් සහ පහසුකම් සලසන්නන්ගේ සේවය සපයා ගැනීමට කටයුතු කළ යුතුය. කාබන් විමෝචනය අවම වන පරිදි පරිසර හිතකාමී ප්‍රවාහන මාධ්‍යයක් තෝරා ගැනීම සිදු කිරීම කළයුතු අතර පරිසරය රස විඳීම සදහා පා ගමනින් යෑම හෝ බයිසිකලය පැදීම පරිසරයට මෙන්ම ශරීරයට ගුණදායක වේ.

පරිසරය සහ ජෛව විවිධත්වය පාදක කොට ගත් සංචාරක ව්‍යාපාර කටයුතුවලදී සංචාරකයා පරිසර හානි අවම වන පරිදි කටයුතු කිරීමට බැදී සිටියි. තමන් පරිසරය වෙතට රැගෙන යන දෑ නැවත් පරිසරයෙන් පිට වීමේදි තමන් සමග රැගෙන ආ යුතුව ඇති අතර පරිසරයෙන් කිසිවක් වෙන් කර රැගෙන නොයා යුතුය.

ජාත්‍යන්තර ආර්ථික විශේෂඥයින් විසින් සිදු කරන ලද අධ්‍යයනයන්ට අනුව සංචාරක කර්මාන්තය යනු ලොව විශාලත්ම මෙන්ම සීග්‍ර වර්ධනයක් පෙන්නුම් කරන කර්මාන්තයක් වන අතර දේශිය ආවේණික සංස්කෘතින් සහ ජෛව විවිධත්වය මත ප්‍රබලව අහිතකර බලපෑම් ඇති කරන්නා වූ කර්මාන්තයකි.

එම නිසා ස්වාභාවික පරිසරයෙහි ඉදිරි පැවැත්ම සඳහා තිරසාර පාරිසරික සංචාරක කර්මාන්ත සංකල්පය ප්‍රවර්ධනය කළ යුතු අතර පාරිසරික සංචාරක කර්මාන්තයෙහි පවතින්නා වූ සරල උපක්‍රම භාවිතා කරමින් පෘථිවි ගෝලයෙහි තිරසාර සංවරධනය අත්දකින්නට කර්මාන්තයෙහි සෑම පාර්ශවකරුවෙකුම උත්සහ කළ යුතුය. ජාත්‍යන්තරය විසින් පාරිසරික සංචාරක ව්‍යාපාරය අර්ථ දක්වා ඇත්තේ පරිසරය සංරක්ෂණය කිරීමට සහ දේශිය ජනතාවගේ සුබසිද්ධිය සැලසීමට දායක වෙමින් ස්වාභාවික පරිසරයෙහි සිදු කරන්නා වූ වගකීම් සහගත සංචාරයක් ලෙසය.

තිරසර පාරිසරික සංචාරක කර්මාන්තය මඟින් දේශීය සංස්කෘතිය සහ ජෛව විවිධත්වය සංරක්ෂණය කෙරෙන අතර සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා පෙළඹවීම් ඇති කරයි. එසේම රැකියා අවස්ථා උත්පාදනය කෙරෙන අතර දේශීය ආර්ථිකය සවිබල ගැන්වීමට දායක වේ. එසේම දැනුවත් කිරීම සහ නිසි පුහුණුව මගින් ප්‍රාදේශීය ජනතාව සවිබල ගන්වා ඔවුන්ව සංචාරක ව්‍යාපාරයේ කළමනාකරණ කටයුතුවලට දායක කර ගැනීමද පාරිසරික සහ සංස්කෘතිකමය වශයෙන් සංචාරකයින් හට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා සහභාගි කරවා ගැනීමද සිදුකළ යුතුම ය. අන්තර් ජාතික වශයෙන් සහ කළාපීය වශයෙන් පිළිගැනීමට පාත්‍ර වූ ආයතන මාර්ගයෙන් සංචාරකයින් අප දේශීය සංචාරක කලාපයන් වෙත කැඳවා ගැනීම සඳහා පියවර ගත යුතුය. මේ අනුව එක්සත් ජාතින්ගේ සංවිධානය විසින් ප්‍රජාව වෙත ඉදිරිපත් කරනු ලැබූ තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පාරිසරික සහ ජනහිතකාමී සංචාරක ව්‍යාපාරයේ අරමුණු දායක කොට ගනිමින් සැබෑ සංවර්ධනයක් අත්පත්කර ගැනීමේ අවස්ථාව අප සතු වනු ඇත.

